# 2024 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ නිර්දේශ ලබා දීම

**විදුහල්පති විසින් නිර්දේශ ලබා දීමේ දී පහත පියවරයන් අනුගමනය කළ යුතු ය.**

1. www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ පිවිස [Login as a principal] යන්න තෝරන්න.
2. ඔබ වෙත යොමු කර ඇති user name හා pass word නිවැරදිව ඇතුළත් කර [Sign in] හරහා පද්ධතියට පිවිසෙන්න.
   2.1. මේ වන විටත් පරිශීලක නාමය (user name) හා මුර පදය (pass word) ලැබී නැත්නම් 011-2075854 දුරකථන අංකය අමතන්න.
   2.2. ඔබ පාසලට අදාළ පරිශීලක නාමය (user name) හා මුර පදය (pass word) විදුහල්පතිට පුද්ගලික ව ලබා දෙන අතර එහි රහස්‍යභාවය සුරැකීම ඔබගේ වගකීමකි. ඒ සම්බන්ධ ගැටලුවක් ඇති වුවහොත් 011-2075854 දුරකථන අංකය අමතන්න.
3. ඔබගේ පාසලෙන් වැටුප් ලබන 2024 වාර්ෂික ගුරු ස්ථාන මාරු අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදයට යොමු කළ ගුරුවරුන්ගේ ලේඛනය තිරයේ දිස් වේ.
4. එම ලේඛනය තුළ ඔබ පාසලෙන් වැටුප් නොලබන ගුරුවරුන් සිටී නම් ඒ පිළිබඳ ව 011-2075854 අංකයට දැනුම් දිය යුතු ය.
5. ගුරුවරයාගේ නම ඉදිරියෙන් option යටතේ icon 3ක් දිස් වේ.
   5.1. පළමු icon එක මගින් අදාළ ගුරුවරයාගේ අයදුම්පත පරීක්ෂා කළ හැක.
   5.2. දෙවන icon එක මගින් අයදුම්පත නිර්දේශ කිරීම සඳහා පිවිසිය හැක.
   5.3. තෙවන icon එක මගින් විදුහල්පති නිර්දේශ කළ පසු නිර්දේශ සහිත පිටුව බාගත කර ගත හැක.
6. ඉහත සඳහන් කළ දෙවන icon එක මගින් පිවිසුනු පසු අනු අංක 01, 02, 03 යටතේ අනුපිළිවෙලින් අදාළ ගුරුවරයාගේ ජාතික හැඳුනුම්පත් අංකය, නම හා වර්තමාන පාසල දිස් වේ.
7. අනු අංක 04හි පත්වීම් විෂයය 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන විෂයය, විශේෂ අධ්‍යාපන හෝ වෙනත් විෂයයක් ද යන්න තේරිය යුතු ය.
8. අනු අංක 05, 06 සහ 07 මගින් ගුරුවරයා ස්ථාන මාරු කිරීමේ දී සලකා බලනු ලබන අංශය, විෂයය හා මාධ්‍යය ඇතුළත් කළ යුතු ය. මෙය අනුප්‍රාප්තික ගුරුවරයා නම් කිරීමට සලකා බලන බැවින් නිරවද්‍යතාවය හොඳින් පරීක්ෂා කළ යුතු ය.
   8.1. අංශය ප්‍රාථමික නම් 2024 නව අධ්‍යයන වර්ෂයේ ඉගැන්වීම් කරන ශ්‍රේණිය නිවැරදි ව තෝරන්න.
9. අනු අංක 08 යටතේ ගුරුවරයා පාසලට අතිරික්ත වන්නේ නම් yes තෝරන්න.
10. ගුරුවරයා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් හෝ පැවැත්වෙමින් පවතී නම් අනු අංක 09 ප්‍රශ්නය සඳහා yes තෝරන්න.
11. ගුරුවරයාගේ ස්ථාන මාරුව සඳහා සලකා බැලිය යුතු විශේෂ රෝගී තත්ත්වයන් හෝ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටී නම්, අනු අංක 10 යටතේ yes තෝරන්න.

11.1. අනු අංක 10 සඳහා yes තෝරන්නේ නම් specify the disease සඳහා අදාළ හේතුව තෝරන්න.

12. අනු අංක 11 යටතේ ගුරුවරයා ස්ථාන මාරුව සඳහා නිදහස් කිරීම පිළිබඳ නිර්දේශ ලබා දිය හැක.

12.1. අනුප්‍රාප්තිකයකු සහිත ව නිදහස් කිරීමට නම් Recommended with successor යන්න තෝරන්න.

12.2. අනුප්‍රාප්තිකයකු රහිත ව නිදහස් කිරීමට නම් Recommended without successor යන්න තෝරන්න.

13. අනු අංක 12 යටතේ ගුරුවරයා පිළිබඳ සඳහන් කළ යුතු විශේෂ කරුණක් ඇත්නම් එය සඳහන් කරන්න.

14. ඇතුළත් කළ සියලු තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර save මත click කරන්න.

15. සියලු ගුරුවරුන්ගේ නිර්දේශ කිරීම් අවසන් වූ පසු ඉහත අංක 5.3 හි සඳහන් කළ icon එක මගින් එම එක් එක් ගුරුවරයාගේ ස්ථාන මාරු අයදුම්පත සඳහා විදුහල්පති නිර්දේශ සහිත පිටුව බාගත කර මුද්‍රණය කර ගත හැක.

16. විදුහල්පති නිර්දේශ සහිත ආකෘතියේ මුද්‍රිත පිටපතෙහි විදුහල්පති විසින් තම අත්සන, දිනය හා නිල මුද්‍රාව තැබිය යුතු ය. ගුරුවරයා විසින් විදුහල්පති වෙත ඉදිරිපත් කර ඇති ස්ථාන මාරු අයදුම්පතේ අවසාන පිටුව ලෙස ඔබ ඉහත අංක 15 යටතේ වූ උපදෙස් පරිදි මුද්‍රණය කර ගත් පිටුව ඇමිණිය යුතු ය.

17. ගුරුවරයා අයදුම්පත සමඟ ඉදිරිපත් කරන අනෙකුත් අතිරේක ලේඛන විදුහල්පති නිර්දේශ පත්‍රිකාවට පසුව ඇමිණිය යුතු ය.

18. සියලු ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබා දී අවසන් වූ පසු, ඔබ පාසලේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ සියලු ගුරුවරුන්ගේ ලේඛනය(TTB/2024/01) තිරයේ ඉහළින් දිස් Download transfer request list මගින් බාගත කර මුද්‍රණය කර ගත යුතු ය.

19. එම මුද්‍රිත ලේඛනයේ විදුහල්පති අත්සන, දිනය හා නිල මුද්‍රාව යෙදිය යුතු ය.

20. අයදුම්පත පිරවීමේ දී ඉහත කරුණුවලට අමතරව යම් තාක්ෂණික ගැටළුවක් පවතී නම් 011- 2075854 හෝ 011-2784434 දුරකථන අංකවලට රාජකාරී කාලය තුළ දැනුම් දිය හැක.

ජේ. එච්. වීරරත්න
අධ්‍යාපන අධ්‍යක්ෂ
ජාතික පාසල් ගුරු ස්ථාන මාරු
අධ්‍යාපන ලේකම් වෙනුවට